# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2426/38 - 2025 මාර්තු මස 04 වැනි අඟහරුවාදා - 2025.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2025 අංක 15 දරන ආඥාව**

*මගේ යොමු අංකය*: LD/05/2005/A/119.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* 3/7/3/1.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වන ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

කේ.ඩී ලාල් කාන්ත
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය

2025 ජනවාරි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** - ප්‍රාදේශීය ලේකම්, වලපනේ.

2. **ඉඩමේ විස්තරය.** මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ඔයපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක 514 ඩී, තැන්නේහේන්වල ග්‍රාම නිළධාරි කොට්ඨාසය, තැන්නෙහේන්වල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක නු 3160 හා 2018.02.07 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැලිවලට මායිම්.

**01. කැබලි අංක '1' - මුල්හල්කැලේ වත්ත - ප්‍රමාණය: හෙක්. 1.1210**
උතුරට: රඹුක්පොත කඳුර සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන මුල්හල්කැලේ වත්ත; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව හිමිකම් කියන මුල්හල් කැලේ වත්ත; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව හිමිකම් කියන මුල්හල්කැලේ වත්ත සහ කැබලි අංක 02 ; බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන මුල්හල්කැලේ වත්ත, කැබලි අංක 2 සහ රඹුක්පොත කඳුර.

**02. කැබලි '3' - මුල්හල්කැලේ වත්ත - ප්‍රමාණය: හෙක්. 0.8437**
උතුරට: රඹුක්පොත කඳුර සහ කැබලි අංක 2; නැගෙනහිර කැබලි අංක 2 ; දකුණට: කැබලි අංක 2, ඇළ සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ රඹුක්පොත කඳුර.

EGO 03-0042

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව**

**2022 අංක 54 දරන ආඥාව**

*ඉඩම් අමාත්‍යාංශයේ මගේ යොමු අංකය:* 4-3/9/2017/IR/448-E.

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය :* අනු/10/5/4/ පහළ මල්වතුඔය ජලාශය

අංක 2324/55 හා 2023.03.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ 2A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද 2022 අංක 54 හා 2023.03.15 දින දරන ශුද්ධි පත්‍රිකාවේ " ශුද්ධි පත්‍රිකාව " ලෙස සඳහන් වී නොමැති බැවින් එයට " ශුද්ධි පත්‍රිකාව " යන්න ඇතුළත් කර සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

කේ.ඩී ලාල් කාන්ත
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය

2025 ජනවාරි මස 08 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”, අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03-0043

---

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය ) 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව**

**2022 අංක 53 දරන ආඥාව**

ඉඩම් අමාත්‍යාංශයේ මගේ යොමු අංකය: 4-3/9/2017/IR/448-D.

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : අනු/10/5/4/ පහළ මල්වතුඔය ජලාශය

අංක 2268/68 හා 2022.02.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සිංහල භාෂාවෙන් පල කරන ලද ඉඩම් අත් කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට අදාල 2022 අංක 53 දරන ආඥාවේ උපලේඛනයේ සඳහන් කැබලි අංක 72 හි දකුණු මායිම කැබලි අංක 65 සහ 72 යන්න කැබලි අංක 65 සහ 69 ලෙසද, කැබලි අංක 73 හි දකුණු මායිම කැබලි අංක 65 සහ කැබලි අංක 69 යන්න. කැබලි අංක 65 සහ කැබලි අංක 72 ලෙසද, කැබලි අංක 105 හි බටහිර මායිම කැබලි අංක 86 යන්න රජයේ හේන සහ කැබලි අංක 86 ලෙසද, කැබලි අංක 203 හි බටහිර මායිම ජල මාර්ගයේ කොටසක් සහ රජයේ කුඹුර යන්න, රජයේ කුඹුර සහ ජල මාර්ගයේ කොටසක් ලෙසද කැබලි අංක 227 හි ඉඩමේ නම කිඹුලැවකැලේ යන්න නම සඳහන් නොවේ ලෙසද දකුණු මායිම කැබලි අංක 229,228, රජයේ කුඹුර සහ ජල මාර්ගයේ කොටසක් යන්න, කැබලි අංක 229, රජයේ කුඹුර, ජල මාර්ගයේ කොටසක් සහ කැබලි අංක 228 ලෙසද, කැබලි අංක 228 හි බටහිර මායිම කැබලි අංක 223 සහ රජයේ කුඹුර යන්න, රජයේ කුඹුර සහ කැබලි අංක 223 ලෙසද, කැබලි අංක 238 හි බටහිර මායිම කැබලි අංක 230,237.236,235,234, 233, 247 වැනි බිම් කැබලි, ජල මාර්ගයේ කොටසක් සහ රජයේ කුඹුර යන්න, ජල මාර්ගයේ කොටසක් රජයේ කුඹුර, කැබලි අංක 230, 237, 236, 235, 234, 233 සහ 247 ලෙසද කැබලි අංක 239 හි ඉඩමේ නම කිඹුලැවකැලේ යන්න නම සඳහන් නොවේ ලෙසද දකුණු මායිම කැබලි අංක 238 සහ ජල මාර්ගයේ කොටසක් යන්න, ජල මාර්ගයේ කොටසක් සහ කැබලි අංක 238 ලෙසද, කැබලි අංක 240හි දකුණු මායිම කැබලි අංක 239, ජල මාර්ගයේ කොටසක් සහ රජයේ කුඹුර යන්න, රජයේ කුඹුර, ජල මාර්ගයේ කොටසක් සහ කැබලි අංක 239 ලෙස ද කැබලි අංක 252 හි නැගෙනහිර මායිම මල්වතුඔයේ කොටසක් හා රජයේ කුඹුරු යන්න, මල්වතුඔයේ කොටසක් සහ රජයේ කුඹුර ලෙසද දකුණු මායිම කැබලි අංක 241,242,243,244, 249, 250, 251 සහ 215, රජයේ කුඹුරු යන්න, රජයේ කුඹුර, කැබලි අංක 241, 242, 243, 244, 249, 250,2 51 සහ 215 ලෙසද, කැබලි අංක 254 හි නැගෙනහිර මායිම කැබලි අංක 99 යන්න කැබලි අංක 99 සහ රජයේ ලඳු කැලය ලෙස ද, නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

කේ.ඩී ලාල් කාන්ත
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය

2025 ජනවාරි මස 08 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”, අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03-0044

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)
38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව**

**2022 අංක 75 දරන ආඥාව**

*ඉඩම් අමාත්‍යාංශයේ මගේ යොමු අංකය*: 4-3/9/2017/IR/448-K.

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : අනු/10/5/4/ පහළ මල්වතුඔය ජලාශය

අංක 2269/62 හා 2022.03.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ සිංහල භාෂාවෙන් පළකරන ලද ඉඩම් අත් කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට අදාල 2022 අංක 75 දරන ආඥාවේ උපලේඛනයේ සඳහන් කැබලි අංක 6 හි ප්‍රමාණය හෙක්ටයාර 0.0044 යන්න, හෙක්ටයාර 0.0440 ලෙසද කැබලි අංක 53 හි බටහිර මායිම රජයේ ලඳු කැලය සහ කැබලි අංක 54 යන්න. කැබලි අංක 54 සහ රජයේ ලඳු කැලය ලෙසද, කැබලි අංක 70 හි ඉඩමේ ප්‍රමාණය හෙක්: 0.0025 යන්න හෙක්: 0.6025 ලෙසද, කැබලි අංක 72 හි බටහිර මායිම කැබලි අංක 9 සහ 96 යන්න, කැබලි අංක 9 සහ 69 ලෙසද නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

අංක 2269/62 හා 2022.03.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ දෙමළ භාෂාවෙන් පළ කරන ලද ඉඩම් අත් කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට අදාල 2022 අංක 75 දරන ආඥාවේ උපලේඛනයේ සඳහන් කැබලි අංක 6 හි ප්‍රමාණය හෙක්ටයාර 0.0044 යන්න හෙක්ටයාර 0.0440 ලෙසද, කැබලි අංක 53 හි බටහිර මායිම රජයේ ලඳු කැලය සහ කැබලි අංක 54 යන්න. කැබලි අංක 54 සහ රජයේ ලඳු කැලය ලෙස ද නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

අංක 2269/62 හා 2022.03.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ඉංග්‍රීසි භාෂාවෙන් පළ කරන ලද ඉඩම් අත් කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට අදාල 2022 අංක 75 දරන ආඥාවේ උපලේඛනයේ සඳහන් කැබලි අංක 70 හි ඉඩමේ ප්‍රමාණය හෙක්: 0.0025 යන්න හෙක්: 0.6025 ලෙස ද නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

කේ.ඩී ලාල් කාන්ත
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය

2025 ජනවාරි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03-0045.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.